ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව - 2022
---------------------------------------------------------------------

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) **2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.**

(ආ) **2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.**

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | සභාවේ අදහස් දැක්වීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ලද පෙර වර්ෂ සඳහා අදාල වන මුද්දර ගාස්තු ආදායම් රු.**294,619,184** ක් සමුච්චිත අරමුදලට බැර කරනු වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායම් ගිණුමට බැර කර තිබුණි. | මෙම වරද ඉදිරි අවසන් ගිණුම් සකස් කිරීමේදී සැලකිල්ලට ගෙන නිවැරදි ගිණුම්වල ඇතුලත් කිරීමට සටහන් කර ගෙන ඇත. කෙසේ වුවද ගිණුම්වල දැනට කර ඇති සටහන් මඟින් අවසන් මූල්‍ය තත්ව ප්‍රකාශයට ඉන් බලපෑමක් සිදු නොවන බව. | අදාල ගිණුම්වල නිවැරදි ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගන්නා ලද රු.**1,540,980**ක් වටිනා භාණ්ඩ අදාල ස්ථාවර වත්කම් ගිණුම් හර කරනු වෙනුවට තොග ගිණුම හර කර තිබුණි. | මෙම වරද ජනල් සටහන් මඟින් නිවැරදි කිරීමට සටහන් කරගෙන ඇති බව . | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රධාන සඳහා ක්‍රමක්ෂය වටිනාකම රු.**8,157,492**ක් වුවත් රු.**6,308,137** ක් ගැලපීම හේතුවෙන ක්‍රමක්ෂය රු.**1,849, 292** ක් අඩුවෙන් ගලපා තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සැලසුම් අංශයේ භූගෝලීය තොරතුරු පද්ධති වියදම් ලෙස රු. **10,050,000** ක් අයවැය ප්‍රතිදාන පදනම් කරගෙන ගිණුම්ගත කර තිබුණද ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ කිසිදු වියදමක් දරා නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම විධිමත් පරිදි තොරාගනු ලබන බාහිර පාර්ශවයක් මඟින් ඉටුකර ගැනීමට සැලසුම් කරගෙන තිබුණද පැන නැඟුණු ගැටළු කිහිපයක් හේතුවෙන් දැනට සභාවේ සේවයේ නියුතු සේවකයන් යොදවා ව්‍යාපෘතියේ කොටස් ඉටු කරවා ගැනීමට කටයුතු කරමින් පවතින අතර ව්‍යාපෘතියේ අදාල වියදම් කළමනාකරණය කරමින් වියදම් දැරීමට බලාපොරොත්තු වන බවත් එම වියදම් මත ණයහිමියන් ලෙස වෙන්කල මුදල තීරණය වේ. එහි ඉතිරි මුදලක් වේ නම් | -එම- |

| | | | |
|---|---|---|---|
| | | ණයහිමියන්ගෙන් කපා හැරීමට අපේක්ෂිත බව. | |
| **(ඉ)** | **දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් ණයට ගැනීම් 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය ලෙස රු.103,565,540 ක් දක්වා තිබූ නමුත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ කෙටිකාලීන ණය (ජංගම) ශේෂය ලෙස රු.21,973,002 ක් ද දිගුකාලීන නොවන ණය (ජංගම නොවන) ශේෂය ලෙස රු.81,592,538 ක් ද ලෙස දක්වා නොතිබුණි.** | **ඉදිරි අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදි වර්ගීකරණයකින් යුක්තව ඉදිරිපත් කරන බව.** | **වර්ගීකරණයන් නිවැරදිව සිදුකළ යුතුය.** |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **රු.50,724,246 ක් වටිනා වත්කම් ගිණුම් ශේෂ 02ක් සහ රු.7,737,850ක් වටිනා වගකීම් ගිණුමක් වෙනුවෙන් ඒවාට අදාල උපලේඛන සහ ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.** | **පරික්ෂා කර බලා නිරවුල් කිරීමට කටයුතු කරන බව.** | **වත්කම් හා වගකීම් ශේෂ සනාථ කර ගැනීමට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතුය.** |

**1.7 අනුකූල නොවීම්**

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.**

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **(අ)** | **(i) මුදල් රෙගුලාසි 396** | **ගෙවීමට තිබෙන නමුත් වලංගු කාලය අවසන් වූ රු.2,398,783 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.** | **මු.රේ 396 සඳහන් පරිදි නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව.** | **මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.** |
| | **(ii) මුදල් රෙගුලාසි 571** | **තැන්පත් කළ දින සිට වර්ෂ 02 ක් ඉක්ම වූ රු.2,533,095 ක් වටිනා තැන්පතු නිරවුල් කර නොතිබුණි.** | **කල් ඉකුත් වූ තැන්පතු සඳහා මු.රේ 571ට අනුව කටයුතු කරමින් පවතින බව.** | **-එම-** |

| | | | | |
|---|---|---|---|---|
| | වෙනත් චක්‍රලේඛ | | | |
| | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත හා 2008.01.25 දිනැති අංක 1533/16 දරන ගැසට් නිවේදනය | භාණ්ඩීය වර්ගීකරණයකට අනුව සභාව විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කළ යුතු කර්මාන්ත 508 කින් බලපත්‍ර ලබා ගෙන තිබුණේ ආයතන 26ක් පමණි. | මේ වන විට 2023 වර්ෂය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර විධිමත් පරිදි නිකුත් කර ඇති බව. | බලපත්‍ර ලබා නොගත් ආයතන සොයා බලා බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | බස්නාහිර පළාත් පාලන දෙපාර්තමේන්තුවේ 2012 ජුලි 01 දිනැති අංක ඩබ්ලිව්පී/එල්ජීඩී/01/2012 චක්‍රලේඛය | චක්‍රලේඛයේ xvi ජේදයේ උපදෙස් ප්‍රකාරව එම සැලසුම් කම්වු උපරිම පැය දෙකකට වැඩියෙන් පැවැත්විය යුතු වුවද ඒ පිළිබද තහවුරු කිරීමකින් තොරව සමහර නිලධාරීන්ට ගෙවීම් කර තිබුණි. | පිළිතුරු සපයා නැත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2** මූල්‍ය සමාලෝචනය

**2.1** මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.305,213,090 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.161,796,825 ක් විය.

**2.2** මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බැංකු ජංගම ගිණුමක දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව බැංකු ගාස්තු හා සෘජු බැංකු හර කිරීම් 2020 වර්ෂයේදී රු.106,216 ක්ද 2021 වර්ෂයේ රු.4,587 ක්ද 2022 වර්ෂයේ රු.1,575ක පැවති අතර එම ශේෂය නිශ්චිතව හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි. | 2020/2021 වර්ෂයන්හිදී බැංකු විසින් ලබා දුන් බැංකු ප්‍රකාශනයන්ට අනුව සෘජු බැංකු හර කිරීම් හඳුනාගෙන ඇති අතර එය මාර්ගගත ක්‍රමය යටතේ සේවකයන්ට කරන ලද ගෙවීම් (අතිකාල/ නිවාඩු දින වැටුප්) ඇතුලත් කිරීමේදී දෙවරක් සටහන් වීම නිසා සිදු වූ වැඩිපුර ගෙවීම වේ. මේ සම්බන්ධ විස්තර ලබා ගෙන නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව. | අදාල නිරවුල් කිරීම් සිදුකළ යුතුය. |

**2.3** ආදායම් පරිපාලනය

**2.3.1** ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2022<br>ඇස්තමේන්තු ගත ආදායම | <br>බිල්කළ ආදායම | <br>රැස්කළ ආදායම | <br>2021 දෙසැ.31 දිනට මුළු හිඟය | 2021<br>ඇස්තමේන්තු ගත ආදායම | <br>බිල් කළ ආදායම | <br>රැස්කළ ආදායම | <br>2020 දෙසැ.31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| (i) වරිපනම් හා බදු | 248,500 | 256,056 | 207,781 | 173,684 | 252,600 | 232,669 | 246,987 | 136,885 |
| (ii) කුලී | 74,181 | 75,250 | 77,390 | 31,776 | 54,654 | 38,799 | 60,899 | 45,006 |
| (iii)බලපත්‍ර ගාස්තු | 20,500 | 27,555 | 27,570 | - | 10,000 | 5,239 | 28,062 | - |
| (iv)වෙනත් ආදායම් | 114 | 106 | 115 | 3 | 1,059,805 | 4,312 | 877,070 | 4,247 |
| | 343,295 | 358,967 | 312,856 | 205,463 | 1,377,059 | 281,019 | 1,213,018 | 186,138 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට අයවිය යුතු වරිපනම් බදු ශේෂය රු.158,305,993 ක් වූ අතර එයින් වාර්ෂික වරිපනම් බදු වටිනාකම රු.50,000ක් ඉක්ම වූ නිවාස, හිස් ඉඩම් හා ව්‍යාපාර ස්ථානයන්හි ගනුදෙනුකරුවන් 477කගෙන් රු.63,065,594ක් අයවිය යුතුව තිබුණි. | රතු නිවේදන නිකුත් කිරීම් සිදුකර ඇත. හිඟ වරිපනම් බදු අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | පනතේ විධි විධාන අනුව හිඟ වරිපනම් අයකර ගත යුතුය. |
| (ආ) | ජන ජය සිටි සුපිරි වෙළඳ සංකීර්ණයේ 10 වන මහලේ ඇති සිනමා ශාලාවේ 2018 නොවැම්බර් සිට බදුකුලී රු.3,879,571 ක් ද වෙළඳ සංකීර්ණය තුල ඇති වෙනත් කඩ 219 කින් අයවිය යුතු හිඟ කුලිය රු.17,402,694 ක් ද විය. | කඩ 219 ක් මුද්‍රා තබා පවරා ගැනීමට කටයුතු කළ අතර මේ අවස්ථා වන විට බොහෝ කඩ හිමියන් නියමිත මුදල් ගෙවා මුද්‍රා ඉවත්කර ගෙන ඇති බව. | අයකර ගත යුතු කුලී ගිවිසුම් අනුව අයකර ගත යුතුය. |
| (ඇ) | ජන ජය සිටි සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ 14ක් දීර්ඝ කාලයක සිට හිස්ව පවතින නිසා එමගින් සභාවට ලැබිය යුතු ආදායම් අහිමි වී තිබුණි. | විගණන වාර්තාවේ සදහන් ඉතිරි කාමර 11 ටෙන්ඩර් කිරීමට ඇති අතර එම කඩ කාමර වල තක්සේරුව ලබා ගැනීම සදහා තක්සේරු දෙපාර්තමේන්තුවට යොමුකර ඇති බව. | ජනජය සිටි වෙළඳ සංකීර්ණයේ බදු දී නොමැති කඩ කාමර බදු දීමට උපාය මාර්ග සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කෝට්ටේ නගර සභාව විසින් **2015/2016** වර්ෂවල නිවාස නොමැති පුද්ගලයින් සඳහා කුලී පදනම මත අංගම්පිටිය නිවාස ලබාදී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 3ක පමණ කාලයක සිට කුලී නොගෙවන නිවාස හිමිකරුවන් 3 දෙනෙකුගෙන් සභාවට අයවිය යුතු නිවාස කුලී ප්‍රමාණය රු.**173,500** ක් විය. | **2022.09.09** සිට මිශ්‍ර ආදායම් අංශයෙන් කසළ බදු අයකිරීම් සිදුකරන අතර හිඟ බදු අයකර ගනිමින් පවතින බව. | හිඟ බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් **31** දිනට සභා බලප්‍රදේශයේ ව්‍යාපාරික ස්ථානවලින් අයවිය යුතු කසල බදු ශේෂය රු.**4,001,126** ක් විය. | **2022.09.09** සිට මිශ්‍ර ආදායම් අංශයෙන් කසළ බදු අයකිරීම් සිදුකරන අතර හිඟ බදු අයකර ගනිමින් පවතින බව. | -එම- |
| (ඊ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේන් සහ අනිකුත් බලධාරීන්ගෙන් **2022** දෙසැම්බර් **31** දිනට ලැබිය යුතු තිබූ උසාවි දඩ ආදායම් වෙනුවෙන් උපලේඛන පිළියෙල කර ආදායම් හඳුනා ගැනීමට කටයුතු නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා උසාවි දඩ මගින් ලැබිය යුතු ආදායම් ගිණුම්ගත කර නොතිබුණි. | උසාවි දඩ අයකර ගැනීමේ කටයුතු සඳහා මේ වනවිට සේවකයින් යොදවා ඇති අතර එය මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතින බව. | -එම- |
| (උ) | වර්ෂයට අදාල මුද්දර ගාස්තු උපලේඛන පිළියෙල කර නොතිබීම හේතුවෙන් වර්ෂයට අදාල නිවැරදි හිඟය හඳුනාගත නොහැකි විය. | එම අඩුපාඩුව නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතින බව. | අදාල උපලේඛන පිළියෙල කර හිඟය හඳුනා ගෙන එවා අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3** මෙහෙයුම් සමාලෝචනය

**3.1** කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කර්මාන්ත බද්ද හා වෙළඳ ව්‍යාපාර බද්දට යටත් දේපල පිලිබඳව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | මේ වන විට ව්‍යාපාර සමීක්ෂණය සිදු කරමින් පවතී. ඒ අනුව බදු අය කිරීම සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂිත බව. | අයකර ගත යුතු බදු මුදල් නිසි පරිදි අයකර ගත යුතුය. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ **9.8**වගන්තිය ප්‍රකාරව විද්‍යුත් මාධ්‍යයෙන් ලංසු ඉදිරිපත් කිරීමට අවසර ලබා නොදුන්නද විද්‍යුත් තැපැල මඟින් මිල ගණන් ගෙන්වා රු.**5,136,200** ක් වටිනා පරිගණක හා ඒ ආශ්‍රිත උපකරණ මිලදී ගෙන තිබුණි. | **2016** අංක **19** දරණ ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත මඟින් විද්‍යුත් මාධ්‍යයෙන් ලංසු ඉදිරිපත් කිරීමට අවසර ලබා දී තිබීමත් කොවිඩ් වසංගත තත්වය නිසා රටේ පැවති අස්ථාවර තත්වය හමුවේ තැපැල් කටයුතු නිසි පරිදි ක්‍රියාත්මක නොවීමත් යන හේතු මත විද්‍යුත් තැපැල් මේ සඳහා භාවිතා කළ බව. | විද්‍යුත් ප්‍රසම්පාදනය සිදුකරන්නේ නම් ලංසුවල රහස්‍යභාවය අරක්ෂා කිරීමට අදාල පාලන ක්‍රම අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාව සතු **2020** ට පෙර පැවති ඉඩම් ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගතකර නොතිබුණි. | ගොඩනැගිලි තක්සේරු කිරිම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කරමින් පවතින අතර තක්සේරු අගයන් ලබා ගැනීමෙන් පසුව ගිණුම්ගත කිරීමට අපේක්ෂිත බව. | තක්සේරු අගයන් ලබාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ජනජය සිටි ගොඩනැගිල්ල රක්ෂණය කිරීම සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණු ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයතනය සභාවේ රක්ෂණ කටයුතු වලින් ඉවත් කිරීමට හේතුව මහා සභා තීරණයේ සඳහන් කර නොතිබුණු අතර සභාව විසින් විධිමත් ලංසු ඇගයීමකින් තොරව ජනජය සිටි ගොඩනැගිල්ල සඳහා අවම මිල සඳහන් පස්වන ලංසුව තෝරාගෙන තිබුණු අතර එකඟ වූ වටිනාකමට අමතරව රු.**491,221**ක් ගෙවා තිබුණි. තවද සියළු පිරිවිතරයන් සපුරා තිබූ රක්ෂණ සමාගමක් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසු ඇගයීම් ක්‍රියාවලියෙන් ඉවත් කර තිබුණි. | තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ අනුව ලබා දී ඇති බව. | ප්‍රසම්පාදන රීතීන් අනුව ක්‍රියාකළ යුතුය. |

**3.2** හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ සේවය කළ වෛද්‍යවරයා ස්ථාන මාරුවක් ලබා සභාවෙන් ඉවත් වී ඇති අතර ඔහුට වැඩිපුර ගෙවූ අතිකාල දීමනාව රු.**716,919** ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වෛද්‍යවරයා විසින් සභාවේ සේවය කරන ලද වැඩිපුර ලබා ගෙන ඇති අතිකාල ප්‍රමාණය රු. **716,919/-** ක මුදල හඳුනා ගත් අතර එහිදි ඔහු වෙත ගෙවීමට තිබූ මාස **2**ක අතිකාල රඳවා ගන්නා ලද අතර ඒ පිලිබඳ ස්ථාන මාරු වීම වූ අදාල වෛද්‍යවරයා දැනුවත් කර ඇති අතර ඉතිරි මුදල ඔහු සේවය කරන නව සේව ස්ථානයට දන්වා මුදල් රෙගුලාසීන්ට අනුව එම මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | වැඩිපුර ගෙවූ වටිනාකම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සාමාන්‍ය නිවාඩු අවසන් වීමෙන් පසුව වැටුප් රහිත නිවාඩු ලබා ඇති සේවකයින් **17**කගෙන් සභාව වෙත අයකර ගැනීමට ඇති මුදල වන රු.**244,405** ක් අයකර ගෙන නොතිබුණි. | **2022.10.25** වන දින අභ්‍යන්තර චක්‍රලේඛ අංක **06/2022** යටතේ විධිමත් පරිදි දේශීය හා විදේශීය නිවාඩු ලබා ගැනීම සම්බන්ධව නාගරික කොමසාරිස් විසින් දක්වා ඇත. වැටුප් රහිතව නිවාඩු ලබා ඇති සේවකයින්ගෙන් අදාල මුදල් අයකර ගැනීම සඳහා උපදෙස් ලබා දී ඇති බව. | අදාල වටිනාකම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3** මානව සම්පත් කළමනාකරණය

| | | |
|---|---|---|
| **දීර්ඝ කාලයක සිට අය නොවී පවතින රු.2,171,860 ක් වටිනාකමැති සේවක ණය අයකර ගැනීම සම්බන්ධයෙන් සභාව විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.** | **ස්ථාන මාරුවීම් විශ්‍රාම ගැනීම් සේවය අතහැර යාම් හා මියගිය නිලධාරීන් නිසා ඇති වූ පුරප්පාඩු බව.** | **අයවිය යුතු මුදල් නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය.** |